ඒල් ඩී ඕ 14/2019

**ශ්‍රී ලංකාවේ ජාතික සයිබර් ආරක්ෂණ උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම පිණිසද, ශ්‍රී ලංකාවේ සයිබර් ආරක්ෂණ නියෝජිතායතනය පිහිටුවීම පිණිසද, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය සහ ජාතික සයිබර් මෙහෙයුම් මධ්‍යස්ථානය සවිබල ගැන්වීම පිණිසද, ශ්‍රී ලංකාව තුළ තීරණාත්මක තොරතුරු යටිතල පහසුකම් ආරක්ෂා කිරීම පිණිසද සහ ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද වූ පනතකි .**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :

ලුහුඩු නාමය හා බලාත්මක දිනය

**1.** (1)මෙම පනත 2019 අංක  දරන සයිබර් ආරක්ෂණ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ .

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වැනි ව්‍යවස්ථාව අනුව මෙම පනතේ VII කොටසේ විධිවිධාන හැර අනෙකුත් විධිවිධාන කතානායකවරයා විසින් මෙම පනතේ සහතිකය සටහන් කළ දිනයේ සිට බලපැවැත්වෙනු ඇත .

(3) මෙම පනතේ VII කොටසේ විධිවිධාන, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ නියෝගයක් පළ කරනු ලබන දිනයේ සිට බලාත්මක වනු ඇත.

## **1**වැනි කොටස

### පනතේ අරමුණු

පනතේ අරමුණු

**2.** පනතේ අරමුණු විය යුත්තේ -

(a) ශ්‍රී ලංකාවේ ජාතික සයිබර් ආරක්ෂණ උපායමාර්ගය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම පිණිස;

(b) ඵලදායි සහ කාර්යක්ෂම ලෙස සයිබර් ආරක්ෂක තර්ජන හා සිදුවීම් වැළැක්වීම, අවම කිරීම හා ඒවාට ප්‍රතිචාර දැක්වීම පිණිස ;

(c) ශ්‍රී ලංකාවේ සයිබර් ආරක්ෂණ නියෝජිතායතනයක් ස්ථාපිත කිරීම පිණිස සහ ආරක්ෂිත සයිබර් ආරක්ෂක පරිසරයක් සඳහා අනෙකුත් ආයතනික රාමුව සවිබල ගැන්වීම පිණිස ; සහ

(d) තීරණාත්මක තොරතුරු යටිතල පහසුකම් ආරක්ෂා කිරීම පිණිස.

## II වැනි කොටස

### ශ්‍රී ලංකාවේ සයිබර් ආරක්ෂණ නියෝජිතායතනය

**සයිබර් ආරක්ෂන නියෝජිතායතනයක් පිහිටුවීම**

**3**. (1) මෙම පනතේ අරමුණු සඳහා ශ්‍රී ලංකාවේ සයිබර් ආරක්ෂණ නියෝජිතායතනය ලෙස ( මින් මතුවට “ නියෝජිතායතනය” ලෙස හඳුන්වනු ලබන) හඳුන්වනු ලබන නියෝජිතායතනයක් පිහිටුවිය යුතුය .

(2) (1) වැනි උපවගන්තිය මඟින් එයට ලබා දී ඇති නාමයෙන්, නියෝජිතායතනය අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක සහිත සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර එහි සංස්ථාපිත නාමයෙන් එය විසින්ද එයට විරුද්ධවද නඩු පවරනු ලැබිය හැකිය.

(3) නියෝජිතායතනය ශ්‍රී ලංකාවේ සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියට සම්බන්ධ සියලුම කරුණු සඳහා අග්‍රස්ථ හා විධායක මණ්ඩලය විය යුතු අතර ශ්‍රී ලංකාවේ සයිබර් ආරක්ෂණ උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමේ වගකීම දැරිය යුතු වන්නේය.

**නියෝජිතායතනයේ බලතල, රාජකාරී සහ කර්තව්‍යන්**

**4.** (1) නියෝජිතායතනයේ බලතල, රාජකාරි සහ කර්තව්‍යයන් විය යුත්තේ :-

(a) මෙහෙයුම් උපායමාර්ගයන්, ප්‍රතිපත්ති, ක්‍රියා සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති පිළියෙළ කිරීම සහ ක්‍රියාත්මක කිරීම ඇතුළු ශ්‍රී ලංකාවේ ජාතික සයිබර් ආරක්ෂණ උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියලුම පියවරයන් ගැනීම;

(b) ශ්‍රී ලංකා රජය සඳහා සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්ති සකස් කිරීම, සියලුම රජයේ ආයතන සහ අනෙකුත් සියලු අදාළ අංශයන්හි ප්‍රතිපත්ති හා ප්‍රමිතීන් යොදාගැනිම සඳහා පහසුකම් සැලසීම පිණිස සහ සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්ති සහ ප්‍රමිතීන් ඇගැයීම සඳහා ඇගැයීම් රාමුවක් සහ නිර්ණායක නිර්දේශ කිරීම;

අදාළ පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීමෙන්, රජයේ සහ අනෙකුත් අදාළ අංශවල තීරණාත්මක තොරතුරු යටිතල පහසුකම් (මින් මතුවට " තීතොය" ලෙස හැඳින්වෙන) හඳුනාගැනීම සහ නිර්ණය කිරීම ;

(c) තීතොය හිමිකරුවන්ගේ අදහස් විමසීමෙන් තීතොය ආරක්ෂා කිරීම සඳහා උපායමාර්ගයන් හා සැලසුම් සකස් කිරීම ;

(d) ශ්‍රී ලංකාවේ සයිබර් ආරක්ෂණය සම්බන්ධයෙන් කේන්ද්‍රීය සම්බන්ධක මධ්‍යස්ථානය කටයුතු කිරීම සහ සයිබර් ආරක්ෂණ කටයුතු සම්බන්ධයෙන් සියලුම රජයේ ආයතනවලට සහ අනෙකුත් අදාළ අංශවලට අවශ්‍ය සියලුම උපදෙස් ලබා දීම;

(e) රජයේ ආයතන සහ අනෙකුත් අදාළ අංශ සඳහා සයිබර් තර්ජන දර්ශක, ආරක්ෂක පියවර, සයිබර් ආරක්ෂණ අවදානම්, සිදුවීම්, විශ්ලේෂණය, සහ සයිබර් ආරක්ෂණය සම්බන්ධ අනතුරු ඇඟවීම් සම්බන්ධ තොරතුරු බහු දිශානතව හා අංශ අතර හුවමාරු කරගන්නා මුහුණතක් ලෙස කටයුතු කිරීම ;

(g) ඕනෑම සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියට අදාළ කරුණු සම්බන්ධයෙන් සයිබර් ආරක්ෂණය සඳහා වන අනෙකුත් අග්‍රස්ථ ආයතන සමඟ ගිවිසුම් වලට එළඹීම සහ එවැනි කරුණු සම්බන්ධයෙන් අන්තර්ජාතික මට්ටමේදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම පිණිස;

(h) සයිබර් ආරක්ෂණ අංශයේ නිපුණ හා ඉහළ කුසලතා ඇති වෘත්තිකයන් බිහිකිරීම සහතික කිරීම සඳහා සයිබර් ආරක්ෂණ කර්මාන්ත ප්‍රමිතීන් සකස් කිරීම ඇතුළු සයිබර් ආරක්ෂණය

සම්බන්ධ විෂය මාලා සහ නිපුණතා සංවර්ධනය කිරීම සඳහා උපකාරී වීම පිණිස ;

(i) සයිබර් ආරක්ෂණ සූදානම වැඩිදියුණු කිරීම සඳහා වරින් වර සයිබර් ආරක්ෂක වැඩමුළු පැවැත්වීම සම්බන්ධීකරණය කිරීම;

(j) නියෝජිතායතනයේ කාර්යයන් සහ කර්තව්‍යන් ඉටුකිරීම පිණිස නියෝජිතායතනයට සහාය වීම සඳහා ආයතන, ඒකක හෝ අනෙකුත් ඕනෑම ආයතනයක් පිහිටුවීම හෝ නම් කිරීම ;

(k) කිසියම් අංශයක තීරණාත්මක වැදගත්කම අනුව විවිධ අංශවල ආංශික පරිගණක හදිසි සූදානම ඇති කණ්ඩායම් පිහිටුවීම හා අවසර ලබා දීම;

(l) නම් කරන ලද තීතොය හිමිකරුවන්ගෙන් සහ අනෙකුත් රජයේ ආයතනවලින් සයිබර් ආරක්ෂණ ඇගැයීම සමඟ අනුකූලතාව වීම සහ තම තීතොය ආරක්ෂා කරගැනීම සඳහා ගන්නා ලද පියවර සම්බන්ධ තොරතුරු ඇතුළත් වාර්තා හෝ ප්‍රතිවාර ඉදිරිපත් කිරීම සඳහා ඉල්ලීම් සිදුකිරීම පණිස ;

(m) සයිබර් අවකාශය තුළ අවදානම පිළිබඳව පුරවැසියන් දැනුවත් කිරීම සහ සයිබර් අවකාශය තුළ ඔවුන්ගේ අනන්‍යතාවය, පෞද්ගලිකත්වය හා ආර්ථික වත්කම් ආරක්ෂා කිරීමට හැකියාව ගොඩනැංවීම පිණිස;

(n) මිලදී ගැනීමෙන් හෝ අනෙකුත් මාර්ගවලින් ඕනෑම චංචල හෝ නිශ්චල දේපළක් අයත් කරගැනීමට සහ නියෝජිතායතනයේ එවැනි ඕනෑම චංචල හෝ නිශ්චල දේපළක් රඳවා තබාගැනීම, කල් බදු හෝ කුලී පදනම යටතේ ලබා දීමට හෝ ලබා ගැනීමට, උකසට තැබීමට, ලබා දීමට සහ විකිණීමට හෝ පනතේ විධිවිධාන අනුව වෙනත් ආකාරයකින් ඉවත් කිරීම පිණිස ;

(o) නියෝජිතායතනය මඟින් තීරණය කරනු ලබන ඕනෑම බැංකුවක ගිණුම් විවෘත කිරීමට හා පවත්වා ගෙන යාමට සහ

නියෝජිතායතනය වෙනුවෙන් එවැනි බැංකු ගිණුමක් හෝ ගිණුම් පවත්වා ගෙන යාමට ඕනෑම පුද්ගලයෙකුට බලය ලබා දීමට;

(p) ඕනෑම මූලාශ්‍රයකින් ප්‍රදානයන් හෝ දායකත්වයන් ලබා ගැනීමට සහ සෑම නීත්‍යානුකූල මාර්ගයකින්ම අරමුදල් රැස්කිරීමට සහ නියෝජිතායතනයේ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකිරීමේදී එම අරමුදල් යොදා ගැනීම පිණිස ;

(q) පනත යටතේ නීති සෑදීමට අවශ්‍ය කරුණු සඳහා නීති සෑදීමට කටයුතු කිරීම ; සහ

(r) නියෝජිතායතනයේ අරමුණු සපුරා ගැනීම සඳහා උපකාරී වන, පනතේ විධිවිධාන සමඟ අනනුකූල නොවන, සියලුම ක්‍රියාවන් සිදුකිරීම පිණිස .

(2) සිය බලතල ක්‍රියාත්මක කිරීමේදී සහ කර්තව්‍යයන් ඉටු කිරීමේදී නියෝජිතායතනය සෑම විටම ශ්‍රී ලංකා පරිගණක හදිසි සූදානම් සංසදය විමසිය යුතු අතර එම බලතල මෙම පනතේ IV වැනි කොටස යටතේ පිහිටුවන ලද ආයතන මඟින් ක්‍රියාත්මක වීම සහතික විය යුතුය .

(3) මෙම පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ අරමුණින් නියෝජිතායතනය විසින් තීරණය කරනු ලබන නිර්ණායකවලට අනුකූලව, රජයේ ආයතනයක හෝ දෙපාර්තමේන්තුවක ප්‍රධානියා විමසීමෙන් එවැනි ආයතනයක හෝ දෙපාර්තමේන්තුවක නිලධාරියෙකු තොරතුරු ආරක්ෂණ නිලධාරියෙකු ( මින් මතුවට “ තොආනි” ලෙස නම් කරනු ලබන) ලෙස නම් කළ යුතුය.

**මණ්ඩලයේ සංයුතිය**

(4) සෑම තොරතුරු ආරක්ෂණ නිලධාරියෙකුම සයිබර් ආරක්ෂණයට අදාළ නියමිත ප්‍රමිතීන් සමඟ රජයේ ආයතනයේ හෝ දෙපාර්තමේන්තුවේ අනුකූලතාව පවත්වා ගැනීම සහතික කළ යුතුය.

5. (1) නියෝජිතායතනයේ කටයුතු කළමණාකරනය හා පරිපාලනය අධ්‍යක්ෂ මණ්ඩලයක් (මින් මතුවට “මණ්ඩලය” ලෙස හැඳින්වෙන) විසින් සිදුවිය යුතු අතර එය පහත ලෙස සංයුතිය තිබිය යුතුවේ –

(a) පහත සඳහන් නිල බලයෙන් පත්වන සාමාජිකයන්, එනම්–

(i) ආරක්ෂක විෂය භාරව පවතින අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ලේකම්වරයා විසින් නම් කරනු ලබන එවැනි අමාත්‍යාංශයක අතිරේක ලේකම්වරයෙක් ;

(ii) රාජ්‍ය පරිපාලනය විෂය භාරව පවතින අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ලේකම්වරයා විසින් නම් කරනු ලබන එවැනි අමාත්‍යාංශයක අතිරේක ලේකම්වරයෙක්;

(iii) මෙම පනත ක්‍රියාත්මක කිරීම භාරව පවතින අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ලේකම්වරයා විසින් නම් කරනු ලබන එවැනි අමාත්‍යාංශයක අතිරේක ලේකම්වරයෙක් ;

(iv) ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ මණ්ඩලය විසින් නම් කරනු ලබන සාමාජිකයෙක් ; සහ

(b) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනක් (මින් මතුවට " පත්කළ සාමාජිකයන්" ලෙස හැඳින්වෙන) මොවුන් සෑම අයෙකුම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, රාජ්‍ය හෝ පුද්ගලික අංශයේ කළමණාකරනය, නීතිය හෝ මූල්‍ය ක්ෂේත්‍රවල වෘත්තීය නිපුණතාව පෙන්වා ඇති වසර 25කට වැඩි පළපුරුද්දක් සහිත පුද්ගලයන් විය යුතුය.

(2) අමාත්‍යවරයා විසින් මණ්ඩලය විමසීමෙන් පසු එක් පත් කළ සාමාජිකයෙක් මණ්ඩලයේ සභාපති ලෙස පත් කළ යුතුය

(3) අසනීප තත්ත්වයක්, ශ්‍රී ලංකාවෙන් බැහැර වීම හෝ වෙනත් ඕනෑම හේතුවක් නිසා සභාපතිවරය තාවකාලිකව සිය තනතුරේ කටයුතු කරගෙන යාමට අපොහොසත් වුවොත් අමාත්‍යවරයා විසින් වෙනත් ඕනෑම සාමාජිකයෙක් සාමාජිකයෙකු ලෙස සිය සාමාන්‍ය කර්තව්‍යන්ට අමතරව සභාපති ලෙස ක්‍රියාකිරීමට පත් කළ යුතුය.

(4) අමාත්‍යවරයා විසින් කිසියම් පුද්ගලයෙකු නියෝජිතායතනයේ සාමාජිකයෙක් ලෙස පත් කිරීමට ප්‍රථම, නියෝජිතායතනයේ සාමාජිකයෙක් ලෙස සිය කාර්යයන් සිදුකිරීමේදී අහිතකර ලෙස බලපෑ හැකි මූල්‍ය හෝ වෙනත් කිසිඳු ළබැඳියා

අතර ගැටුමක් එම පුද්ගලයා හට නියෝජිතායතනයේ කටයුතු සමඟ නොමැති බවට සෑහීමට පත්විය යුතුය.

(5) නියෝජිතායතනයේ කිසිදු සාමාජිකයෙක් පත් කිරීමෙන් පසුවද ඉහත (4) වැනි උප වගන්තියේ දැක්වෙන පරිදි ළබැදියාවක් අත් කර නොගන්නා බවට අමාත්‍යවරයා විසින් කලින් කලට සෑහීමට පත්වීමට හැකි විය යුතුය.

(6) නියෝජිතායතනය විසින් සිදුකරන ලද හෝ සිදුකිරීමට යෝජිත කිසිදු ගිවිසුමක් කිසියම් ආකාරයකින් සෘජුව හෝ වක්‍රව උනන්දුවක් දක්වන නියෝජිතායතනයේ සාමාජිකයෙකු තම උනන්දුව කෙබඳු ආකාරදැයි නියෝජිතායතනයේ රැස්වීමකදී හෙළි කළ යුතු අතර එවැනි හෙළිකිරීමක් නියෝජිතායතනයේ කාර්ය සටහන්වල සටහන් විය යුතු අතර එම සාමාජිකයා එම ගිවිසුම සම්බන්ධ නියෝජිතායතනයේ කිසිදු සාකච්ඡාවකට හෝ තීරණයකට සහභාගි නොවිය යුත්තේය.

මණ්ඩලයේ සාමාජිකත්වය අහිමි වීමට හේතු

**6.** කිසියම් පුද්ගලයෙකු සාමාජිකයෙක් ලෙස පත් කිරීම හෝ දිගටම කටයුතු කිරීම හෝ පහත සඳහන් දෑ නිසා අහිමි විය හැක -

(a) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්, පළාත් සභා මන්ත්‍රීවරයෙක් හෝ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් වීම හෝ ලෙස පත් වීම; හෝ

(b) නියෝජිතායතනය මඟින් හෝ ඒ වෙනුවෙන් සිදු කරන ලබන කිසිදු ගිවිසුමක් යටතේ සෘජුව හෝ වක්‍රාකාරව, ඔහු හෝ ඔහු වෙනුවෙන් ඕනෑම පුද්ගලයෙක් කිසියම් අයිතිවාසිකමක් හෝ ප්‍රයෝජනයක් ලැබීම හෝ භුක්ති විඳීම ; හෝ

(c) ශ්‍රී ලංකාවේ බලාත්මක ඕනෑම නීතියක් යටතේ මානසික ආබාධයක් ඇති බවට ප්‍රකාශ වී ඇත්තේ නම් ; හෝ

(d) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ඕනෑම රටක නීතියක් යටතේ ණය ගෙවීමට නොහැකි හෝ බුන්වත් ලෙස සැලකෙන පුද්ගලයෙකු නම්; හෝ

(e) ශ්‍රී ලංකාව හෝ වෙනත් ඕනෑම රටක අධිකරණයකින් අපරාධ වරදකට වරදකරු .

**මණ්ඩලයේ රැස්වීම්**

**7.**(1) මණ්ඩලයේ සෑම රැස්වීමක්ම සභාපතිගේ මූලිකත්වයෙන් පැවැත්විය යුතුය. ඕනෑම රැස්වීමක් සඳහා සභාපති නොපැමිණි විටදී මුලසුන දැරීමට සාමාජිකයෙක් එහි සිටින සාමාජිකයන් විසින් ඡන්දයකින් තෝරාගත යුතුය.

(2) නියෝජිතායතනයේ ඕනෑම රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් සතරක් වේ .

(3) මණ්ඩලයේ ඕනෑම රැස්වීමක තීරණ සම්බන්ධ ගැටළු රැස්වීමේ සිටින සාමාජිකයන් බහුතරයකගේ ඡන්දයෙන් තීරණය කෙරෙනු ඇත. ඡන්ද ගණන සමාන වන අවස්ථාවකදී සභාපතිවරයා හෝ එම රැස්වීමේ මුලසුන දරන සාමාජිකයා හට ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් ඇත්තේය .

(4) මෙම කොටසේ පෙර සඳහන් විධිවිධානවලට යටත්ව මණ්ඩලය විසින් රැස්වීම් සඳහා පටිපාටිය සහ එවැනි රැස්වීම්වල කටයුතු සිදුවන ආකාරය ගැසට් පත්‍රයේ පළ කරන රීති මාර්ගයෙන් නියාමනය කරනු ලබනු ඇත.

නියෝජිතායතනයේ මුද්‍රාව
y

**8.** (1) නියෝජිතායතනයේ මුද්‍රාව
-

(a) මණ්ඩලය විසින් කලින් කලට තීරණය කරන ලබන පුද්ගලයන්ගේ භාරයේ පැවතිය යුතුය;

(b) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කළ හැක; සහ

(c) මණ්ඩලයේ අවසරය ඇතිව සිය නියෝජනයේ සාක්ෂියක් ලෙස නීතිමය ලියැවිල්ල හෝ ලේඛනයෙහි අත්සන් තබන මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු හමුවේ මිස එය කිසිදු නීතිමය ලියවිල්ලකට හෝ ලේඛනයකට මුද්‍රාව නොතැබිය යුත්තේය . තවද එවැනි අත්සන් තැබීමක් ඕනෑම පුද්ගලයෙකු සාක්ෂිකරුවෙක් වශයෙන් අත්සන් තැබීමෙන් ස්වායත්ත විය යුත්තේය.

(2) නියෝජිතායතනයේ මුද්‍රාව තබා ඇති නීතිමය ලියැවිලි සහ ලේඛනවල නිල ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වා ගෙන යා යුත්තේය.

පුරප්පාඩු හේතුවෙන් හෝ පත්වීමේ වරදක් නිසා ක්‍රියාවන් අවලංගු නොවන බව

**9**. මණ්ඩලයේ කිසිදු ක්‍රියාවක්, තීරණයක් හෝ ක්‍රියා පරිපාටියක්, මණ්ඩලයේ පුරප්පාඩුවක් පැවතීම හෝ මණ්ඩලයට සාමාජිකයෙක් පත් කිරිමේ වරදක් යන හේතුන් නිසාම අවලංගු නොවේ .

සාමාජිකයන්ගේ පාරිශ්‍රමිකය

**10**. නිල බලයෙන් පත්වූ සාමාජිකයන් හැර නියෝජිතායතනයේ අනෙකුත් සාමාජිකයන්, මුදල් විෂය දරන අමාත්‍යවරයා විමසීමෙන් අමාත්‍යවරයා විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි පාරිශ්‍රමික ලබනු ඇති අතර සිය කර්තව්‍යයන් කලින් කලට තීරණය කරනු ලබන නියම හා කොන්දේසිවලට යටත්ව සිදුකළ යුත්තේය .

පත්කළ සාමාජිකයන්ගේ ධූර කාලය

**11**. (1) සෑම පත් කළ සාමාජිකයෙක්ම, මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරිම මඟින් ධූරයෙන් කලින් ඉවත් වුවහොත් හැරුණු විට තමා පත් කළ දිනයේ සිට වසර තුනක කාලයක් තනතුර දැරීම සඳහා සුදුසු වන අතර ඔහුව ඉවත් නොකළේ නම් නැවත වරක් පත් කිරිමට සුදුසුකම් ලබයි.

(2) ඔහු යෝග්‍යයැයි සලකන්නේ නම් ඕනෑම පත් කළ සාමාජිකයෙක්, අමාත්‍යවරයා විසින් ඒ සඳහා අදාළ කරුණු ඉදිරිපත් කිරීමෙන්, පසු ධුරයෙන් ඉවත් කළ හැක්කේය .

(3) ඕනෑම පත් කළ සාමාජිකයෙක් ඕනෑම අවස්ථාවක, අමාත්‍යවරයාට ඒ බව දන්වමින් ලියාපදිංචි තැපෑලෙන් ලිපියක් යැවීමෙන් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැක්කේය.

(4) ඕනෑම පත් කළ සාමාජිකයෙකු මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා ධුරයේ පුරප්පාඩුවක් ඇති වූ විට අමාත්‍යවරයා විසින් 5(b) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව එම සාමාජිකයා වෙනුවට වෙනත් ඕනෑම පුද්ගලයෙකු පත් කළ හැක්කේය. එලෙස පත් කරනු ලබන ඕනෑම පුද්ගලයෙකු තමන් අනුප්‍රාප්ත වන පුද්ගලයාගේ ඉතිරි ධුරකාලය දරනු ලබන්නේය.

(5) පත් කළ සාමාජිකයෙක් අසනීප තත්ත්වයක් හේතුවෙන්, ලංකාවෙන් බැහැර වීම නිසා හෝ දිගු කාලීනව රෝගී වීම නිසා මාස තුනකට නොඅඩු කාලයක් තුළ තාවකාලිකව තම රාජකාරි ඉටුකිරීමට අපොහොසත් වුවහොත් එම අපොහොසත් වීම පිළිබඳව අමාත්‍යවරයා ලිඛිතව දැනුවත් කිරීම අදාළ සාමාජිකයාගේ වගකීම වේ. අමාත්‍යවරයා 5(b) කොටසේ විධිවිධාන අනුව, එවැනි තොරතුරක් ලැබුනු විට, ඔහු වෙනුවට කටයුතු කිරීමට වෙනත් පුද්ගලයෙක් පත් කරනු ඇත .

## III වැනි කොටස

### නියෝජිතායතනයේ අධ්‍යක්ෂ ජනරාල් සහ කාර්ය මණ්ඩලය පත් කිරීම

අධ්‍යක්ෂ ජනරාල් පත් කිරීම

**12.** (1) මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව නියෝජිතායතනය විසින් සකස් කරන ලද බඳවා ගැනීමේ පටිපාටියට අනුව අමාත්‍යවරයා විමසීමෙන් නියෝජිතායතනය විසින් පුද්ගලයෙකු අධ්‍යක්ෂ ජනරාල් ලෙස පත් කළ යුතුය .



10

(2) උප වගන්තිය (1) හි සඳහන් බඳවා ගැනීමේ පටිපාටියේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට අදාළ සුදුසුකම් සඳහන් විය යුතුය,

(a) විද්‍යා හෝ ඉංජිනේරු ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ; සහ

(b) සයිබර් ආරක්ෂණ හෝ ඊට සම්බන්ධ ක්ෂේත්‍රයක් දස වසරක ජ්‍යෝෂ්ඨ විධායක මට්ටමේ පළපුරුද්ද.

(3) (1) වැනි උප වගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයා නියෝජිතායතනයේ ප්‍රධාන විධායක නිලධාරියා වේ.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා නියෝජිතායතනයේ පොදු මඟ පෙන්වීම්වලට හා පාලනයට යටත්ව –

(a) කාර්ය මණ්ඩලය පරිපාලනය සහ පාලනය ඇතුළුව නියෝජිතායතනයේ කටයුතු පරිපාලනය කිරීමේ වගකීම දැරිය යුතුවේ;

(b) නියෝජිතායතනයේ සියලුම තීරණ ක්‍රියාවට නැංවීමේ වගකීම දැරිය යුතුවේ ;

(c) මණ්ඩලය විසින් ඔහු වෙත පවරන , මෙම පනත යටතේ නියෝජිතායතනයට ලැබෙන බලතල හා කර්තව්‍යවන්, ක්‍රියාත්මක කළ යුතුවේ ;

(d) මණ්ඩලයට ලේකම් ලෙස කටයුතු කළ යුතු වේ .

(5) (1) වැනි උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල්ගේ නිල කාලය මුල් පත්වූ දිනයේ සිට වසර තුනක කාලයක් වන අතර නැවත පත් කිරීමට සුදුසුකම් ලබයි.

(6) මරණය, ධූරයෙන් පහ කිරීම හෝ නිලය දරන තැනැත්තා තමන් විසින් මණ්ඩලයට යොමු කරන ලද ලිපියකින් ඉල්ලා අස්වීම මඟින් අධ්‍යක්ෂ ජනරාල් නිලයේ පුරප්පාඩුවක් ඇති වුවහොත් (1) වැනි උප වගන්තිය යටතේ පත්වීමක් කෙරෙන තෙක් නියෝජිතායතනය විසින් නියෝජිතායතනයේ වෙනත් ඕනෑම ජ්‍යෝෂ්ඨ නිලධාරියෙකු අධ්‍යක්ෂ ජනරාල් ධූරයේ කටයුතු කිරීමට පත් කළ යුතුය

(7) අධ්‍යක්ෂ ජනරාල් වරයා මණ්ඩලයේ රැස්වීම්වලට සහභාගි විය යුතු වුවද එම කිසිම රැස්වීමක ඡන්දය ලබා දීමේ අයිතියක් නොමැත.

(8) සිය පත්වීමේ කොන්දේසිවලට අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයා නිලය දැරිය යුතු අතර මුදල් විෂය භාර අමාත්‍යවරයා සමඟ විමසීමෙන් පසු අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් නියෝජිතායතනයේ අරමුදල්වලින් ඔහුට ගෙවිය යුතුය

(9) අධ්‍යක්ෂ ජනරාල්වරයා පහත සඳහන් දෑ කරන කොටගෙන නියෝජිතායතනය විසින් ධුරයෙන් ඉවත් කළ හැක –

(a) ඔහුගේ රාජකාරි ඉටුකිරීමට ස්ථිර ලෙසම අසමත් වීම ;

(b) නියෝජිතායතනයේ යහපතට අහිතකර හෝ වංචාසහගත හෝ නීතිවිරෝධී ස්වභාවයක් සහිත ඕනෑම ක්‍රියාවක් සිදුකිරීම ; හෝ

(c) නියෝජිතායතනය විසින් නිකුත් කරන ලද නියෝග පිළිපැදීමට අසමත් වීම.

(10) අධ්‍යක්ෂ ජනරාල් විසින් මණ්ඩලයේ අනුමැතිය සහිතව මෙම පනත මඟින් තමාට ලබා දී ඇති බලතල හෝ කර්තව්‍යන් නියෝජිතායතනයේ නිලධාරියෙක් වෙත ලිඛිතව පැවරිය හැකි අතර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නියෝග සහ පාලනයට යටත්ව එවැනි නිලධාරියෙක් විසින් එම බලතල හෝ කර්තව්‍යන් ඉටු කළ යුතුය .

**නියෝජිතායතනයේ අනෙකුත් නිලධාරීන් සහ සේවකයන්**

**13**. (1) මෙම පනත යටතේ එය වෙත පවරා ඇති බලතල හා කර්තව්‍යන් කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම සඳහා අවශ්‍ය බවට නියෝජිතායතනය විසින් සලකනු ලබන නිලධාරීන් හා සේවකයන් සංඛ්‍යාවක් එයට පත් කළ හැක.

(2) පනත මඟින් එය එය වෙත පැවරී ඇති බලතල හා කර්තව්‍යන් ක්‍රියාත්මක කිරීමට හා ඉටුකිරීමට නියෝජිතායතනයට සහාය වීම සඳහා එය විසින් අවශ්‍ය යැයි සලකනු ලබන නිලධාරීන් හා සේවකයන් පත් කිරීමේදී නියෝජිතායතනය විසින් සයිබර් ආරක්ෂණය හෝ නියෝජිතායතනය විසින් තීරණය කරනු ලබන එයට සම්බන්ධ ඕනෑම ක්ෂේත්‍රයක හැකියාව සහිත ඔප්පු කළ හැකි පළපුරුද්දක් සහිත පුද්ගලයන්ගේ සේවය ලබා ගත යුතුය

(3) නියෝජිතායතනය විසින් එවැනි නිලධාරීන් හා සේවකයන් සම්බන්ධ විනය පාලනය කළ යුතුය.

(4) නිලධාරින් හා සේවකයන්ට පාරිශ්‍රමික ගෙවීමේදී මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසීමෙන් එබඳු ආකාරයෙන් හා එබඳු අනුපාතවලින් ගෙවිය යුතු අතර නියෝජිතායතනය විසින් තීරණය කරනු ලබන සේවා කොන්දේසිවලට යටත් විය යුත්තේය.

**නියෝජිතායතනයේ කාර්ය මණ්ඩලයට රජයේ සේවකයන් පත් කිරීම**

**14.** (1) නියෝජිතායතනයේ ඉල්ලීම පරිදි රාජ්‍ය සේවයේ නියුතු ඕනෑම නිලධාරියෙකු, එම නිලධාරියාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා නියෝජිතායතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කළ හැක්කේය. නැතහොත් එම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරවමද පත් කරනු ලැබිය හැක.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධාරියෙකු නියෝජිතායතනයේ කාර්යමණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවකදී 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14වැනි වගන්තියේ (2) වැනි උප වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස්කිරීම් සහිතව ඒ නිලධාරියාට සහ එම නිලධාරියා සම්බන්ධයෙන් අදාළ කර ගනු ලැබිය යුතුය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධාරියෙකු නියෝජිතායතනයේ කාර්යමණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවකදී 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස්කිරීම් සහිතව ඒ නිලධාරියාට සහ එම නිලධාරියා සම්බන්ධයෙන් අදාළ කර ගනු ලැබිය යුතුය.

(4) කිසියම් ගිවිසුමක් යටතේ රජය වෙනුවෙන් කිසියම් කාලසීමාවක් තුළ සේවය කිරීමට එකඟ වූ යම් තැනැත්තෙක් නියෝජිතායතනය විසින් සේවයේ යොදවන්නේ නම් එබඳු ගිවිසුමක වගකීම් ඉටු කිරීමේදී මණ්ඩලට වෙත අදාළ පුද්ගලයාගේ සේවය ලබා දෙන ඕනෑම කාලසීමාවක් රජය වෙනුවෙන් කළ සේවයක් ලෙස සලකනු ලැබිය යුතුය .

## **IV** වැනි කොටස

### නියෝජිතායතනයට සහාය දැක්වීම සඳහා ආයතනික රාමුව

**ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය**

**15.**(1) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (මින් මතුවට "CERT ආයතනය" ලෙස හැඳින්වෙන) ශ්‍රී ලංකාව තුළ සයිබර් ආරක්ෂණයට අදාළ සිදුවීම් සම්බන්ධයෙන් ජාතික සම්බන්ධතා මධ්‍යස්ථානය විය යුත්තේය.

(2) CERT ආයතනය විසින් මෙම පනත යටතේ සිය බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට නියෝජිතායනයට සෑම විටකම සහාය දැක්විය යුතුය .

(3) තම සාංගමික ව්‍යවස්ථාවේ දක්වා ඇති බලතල හා කාර්යයන්ට අමතරව CERT ආයතනය සතුව පහත සඳහන් බලතල හා කාර්යයන් තිබිය යුතුවේ:-

(a) ශ්‍රී ලංකාවේ ජාතික පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය ලෙස කටයුතු කිරීම සහ සයිබර් ආරක්ෂණ සිදුවීම් හා ප්‍රතිචාර සඳහා CERT ආයතනය සහ නියෝජිතායතන විසින් අනුමත කරන ලද ආංශික පරිගණක හදිසි ප්‍රතිචාර සංසද අතර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය ලෙස කටයුතු කිරීම ;

(b) සයිබර් ආරක්ෂණ සිදුවීම් සම්බන්ධ කටයුතු සිදුකිරීමේදී ජාතික සම්බන්ධතා මධ්‍යස්ථානය ලෙස කටයුතු කිරීම ;

(c) සයිබර් ආරක්ෂණ සිද්ධීන් වෙත කාලෝචිත ප්‍රතිචාර හරහා සක්‍රිය සයිබර් ආරක්ෂක සේවාවන් සිදු කිරීම හා එමගින් සිදුවන හානිය අවම කිරීම පිණිස;

(d) දැනුවත් කිරීම්, පර්යේෂණ සහ පුහුණුව මගින් සිදුවීම් වැලැක්වීම සඳහා ක්‍රියාකාරී සේවාවන් පැවැත්වීම;

(e) ඩිජිටල් ව්‍යෝහාරික පරීක්ෂණ සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම.

(f) ඕනෑම රජයේ ආයතනයක හෝ අනෙකුත් අදාළ අංශයන්හි ඉල්ලීම මත සයිබර් ආරක්ෂණ ගැටළු සම්බන්ධයෙන් කාලෝචිත තාක්ෂණික සහාය ලබා දීම;

(g) රජයේ ආයතන සහ අනෙකුත් අංශ සඳහා ඉල්ලීම් මත, සයිබර් ආරක්ෂණ සේවා පවත්වාගෙන යාම සහ කළමණාකරනය කිරීම;

(h) කාලෝචිත ආකාරයකින් සයිබර් තර්ජන පිළිබඳ තොරතුරු රජයේ ආයතන, අනෙකුත් අංශ සහ පොදු ජනතාව සමඟ හුවමාරු කර ගැනීම;

(i) නියෝජිතායතනය වෙත ජාතික මට්ටමේ සයිබර් තර්ජන පිළිබඳ තොරතුරු ලබා දීම;

(j) ශ්‍රී ලංකාවේ සයිබර් ආරක්ෂණය ආශ්‍රිත සිදුවීම් සඳහා ඵලදායි සම්බන්ධීකරණය සහ ප්‍රතිචාරය සහතික කිරීම සඳහා අන්තර්ජාතික පරිගණක හදිසි ප්‍රතිචාර සංසදවල සාමාජිකත්වය ලබා ගැනිම සහ පවත්වා ගැනීම, සහයෝගයෙන් කටයුතු කිරීම.

ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානය

**16.(1)** මෙම පනතේ අරමුණ වෙනුවෙන් අමාත්‍යවරයා විසින් නම් කරන ලද ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානයක් ( මින්මතුවට “NCSOC “ ලෙස හැඳින්වෙන) තිබිය යුත්තේය.

(2) NCSOC නම් කිරීම මඟින් අමාත්‍යවරයා විසින් නියෝජිතායතනයේ එකඟතාවය ඇතිව ගැසට් පත්‍රයේ පළ කරන නියෝගයක් මඟින් මෙම කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට වගකීම දරන CERT ආයතනය හෝ නියෝජිතායතනය විසින් පිහිටුවන වෙනත් ඕනෑම ආයතනයක්, ඒකකයක්, ඒ සඳහා නම් කරනු ලැබිය හැක.

(3) (2) වැනි උප වගන්තියේ සඳහන් නියෝගය සෑදීමේදී අමාත්‍යවරයා විසින් ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානයක බලතල හා කර්තව්‍යයන් ඉටු කිරීමට අදාළ ආයතනයේ සමස්ත හැකියාවට සාපේක්ෂව ධාරිතාවය හා ප්‍රවීණතාවය සැලකිල්ලට ගත යුතුය.

(4) මෙම පනත යටතේ නියෝජිතායතනයට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමට සහ කර්තව්‍යයන් ඉටු කිරීමට NCSOC විසින් නියෝජිතායතනයට අවශ්‍ය සියලු සහාය ලබා දිය යුතුය.

(5) ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානයේ බලතල හා කර්තව්‍යයන් වන්නේ :-

(a) සක්‍රිය ලෙස සිදුවිය හැකි සයිබර් ආරක්ෂණ සිදුවීම් හඳුනා ගැනීම සහ සයිබර් ආරක්ෂණ සිදුවීම්වලට සම්බන්ධීකරණය කළ ප්‍රතිචාරයක් ලබා දීමට පහසුකම් සැපයීම;

(b) විභව්‍ය සයිබර් තර්ජනවල හඳුනාගැනීම, විමර්ෂණය කිරීම හා ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා රජය හා අනෙකුත් අංශවලට අයත් නම් කරන ලද තීතොය අධීක්ෂණය කිරීම;

(c) දේශීය හා අන්තර්ජාතික මූලාශ්‍රවලින් සයිබර් තර්ජන පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම;

(d) සයිබර් තර්ජන පිළිබඳ තොරතුරු නීතිය ක්‍රියාත්මක කරන ආයතන, CERT ආයතනය සහ නියෝජිතායතනයට ලබා දීම තුළින් සයිබර් ආරක්ෂණ සිදුවීම් වැළැක්වීමට කටයුතු කිරීම .

**අමාත්‍යවරයා විසින් නියෝජිතායතනයට සහාය වීම සඳහා අනෙක් ආයතනවල සහාය ලබා ගැනීම**

**17**.නියෝජිතායතනයේ හා CERT ආයතනයේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් අවශ්‍යතාව, ජාතික ආරක්ෂාව, ජාතික ආර්ථිකය හා මහජන සාමය පිළිබඳ හෝ වෙනත් ආයතනවල සහාය අවශ්‍ය වෙනත් ඕනෑම කරුණක් මත නියෝජිතායතනයේ බලතල ක්‍රියාත්මක කිරීමට හා කර්තව්‍ය ඉටු කිරීමට එවැනි ආයතනවල සහාය ඉල්ලා සිටිය හැක.

## V වැනි කොටස

### තීරණාත්මක තොරතුරු යටිතල පහසුකම්

**පරිගණයක් හෝ පරිගණක පද්ධතියක් තීතොය ලෙස නම් කිරීම**

**18**. (1) පහත සඳහන් කරුණු ගැන නියෝජිතායතනය සෑහීමට පත්වන්නේ නම් නියෝජිතායතනය හඳුනාගෙන පරිගණයක් හෝ පරිගණක පද්ධතියක් තීතොය ලෙස නම් අමාත්‍යවරයාට නිර්දේශ කළ යුත්තේය-

(a) එම පරිගණකය හෝ පරිගණක පද්ධතිය මහජන සෞඛ්‍ය, මහජන ආරක්ෂාව, පුද්ගලිකත්වය, ආර්ථික ස්ථාවරත්වය, ජාතික ආරක්ෂාව, අන්තර්ජාතික ස්ථාවරත්වය සඳහා අත්‍යවශ්‍ය සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සහ තීරණාත්මක සයිබර් අවකාශයේ තිරසාරභාවය සහ නැවත පිහිටුවීම සඳහා හෝ නියම කර ඇති වෙනත් ඕනෑම නිර්ණායකයක් සඳහා අවශ්‍ය වීම සහ එය අඩාල වීම සහ විනාශ වීම මහජන සෞඛ්‍ය, මහජන ආරක්ෂාව, පුද්ගලිකත්වය, ආර්ථික ස්ථාවරත්වය, ජාතික ආරක්ෂාව, අන්තර්ජාතික ස්ථාවරත්වය සඳහා හෝ රජයේ හෝ ආර්ථිකයේ ඵලදායි ලෙස පැවතීම සඳහා බරපතල බලපෑමක් ඇති කිරීමට හැකියාවක් තිබීම. ;සහ

(b) පරිගණකය හෝ පරිගණක පද්ධතිය සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් ලංකාවේ පිහිටා තිබීම; සහ

(2) (1) වැනි උප වගන්තියේ අරමුණ සඳහා නියෝජිතායතනය විසින් උප වගන්තිය (1) යටතේ නිර්දේශ කිරීමට පෙර එම නම් කරන ලද තීතොය අධීක්ෂණය හෝ නියාමනය කිරීමට නියම කොට ඇති ඕනෑම ලිඛිත නීතියක් යටතේ පිහිටුවා ඇති නියාමන හෝ අධීක්ෂණ ආයතනයේ අනුමැතිය ලබා ගත යුතුය.

(3) නම් කරන ලද තීතොය වල හිමිකාරිත්වය හෝ මෙහෙයවීම රජයේ ආයතන හෝ වෙනත් ආයතන වලට විය හැක.

(4) (1) වැනි උපවගන්තිය යටතේ නියෝජිතායතනයේ නිර්දේශය මත අමාත්‍යවරයා ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයක් මඟින් එවැනි පරිගණයක් හෝ පරිගණක පද්ධතියක් තීතොය ලෙස නම් කිරීම හා නිර්දේශ කිරීම සිදු කළ යුතුය.

(5) (3) වැනි උප වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරන නියෝගය මඟින් -

(a) තීරණාත්මක තොරතුරු යටිතල පහසුකමක් ලෙස නම් කරන පරිගණකය හෝ පරිගණක පද්ධතිය හඳුනාගත යුතුය;

(b) එලෙස තීරණාත්මක තොරතුරු යටිතල පහසුකමක් නම් කරන පරිගණකයේ හෝ පරිගණක පද්ධතියේ හිමිකරු හඳුනාගත යුතුය;

(6) මෙම පනතේ අරමුණු සඳහා තීතොය සඳහා වගකීම දරන ආයතනයේ ප්‍රධානියා එම තීතොය හි " හිමිකරු" ලෙස පිළිගැනේ.

(7) (1) උප වගන්තිය යටතේ අර්ථ දක්වා ඇති පරිදි තීරණාත්මක තොරතුරු යටිතල පහසුකමක නිර්ණායක සැපිරීමට අදාළ පරිගණකය හෝ පරිගණක පද්ධතිය අසමත් බව නියෝජිතායතනයේ මතය වේ නම් නියෝජිතායතනය විසින් ඕනෑම තීතොය ක නම් කිරීම ඕනෑම අවස්ථාවක ඉවත් කරන ලෙස අමාත්‍යවරයාට නිර්දේශ කළ හැක.

(8) (7) වැනි උප වගන්තිය යටතේ එවැනි නිර්දේශයක් ලැබුනු පසු අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයක් මඟින් අදාළ පරිගණකය හෝ පරිගණක පද්ධතිය තීතොය ලෙස නම් කිරීම ඉවත් කළ යුතුය.

**තීතොය හිමිකරුවන්ගේ වගකීම්**

**19**. (1) පරිගණයක් හෝ පරිගණක පද්ධතියක් තීතොය ලෙස නම් කළ පසු එම තීතොය හි හිමිකරු -

(a) තීතොයහි ආරක්ෂාව සඳහා වගකීම දරන අතර තීතොය ආරක්ෂා කිරීම සඳහා නියම කර ඇති අවශ්‍ය සෑම පියවරක්ම ගත යුතුවේ.

නැතහොත් තීතොය බහු සංවිධාන හෝ බහු අංශයන් හරහා ව්‍යාප්තව තිබේ නම් එවැනි ආයතනවල හෝ අංශයන්හි සියලුම ප්‍රධානීන් ඒකාබද්ධව හා සමාන ලෙස තීතොය ආරක්ෂාව සඳහා වගකීම දරනු ලැබිය යුතුවේ .

(b) පහත දෑ කෙරෙහි වගකීම දැරිය යුතුය -

(i) තීතොය ආරක්ෂාව සඳහා සැලැසුමක් සැකසීම හා ක්‍රියාත්මක කිරීම කෙරෙහි.;

(ii) නියෝජිතායතනය හෝ මෙම පනත යටතේ නියෝජිතායතනයේ රාජකාරි සහ කාර්යයන් ඉටුකිරීම සඳහා නියෝජිතායතනය මඟින් පිහිටුවන ලද හෝ නම් කරන ලද වෙනත් කිසියම් ආයතනයක්, ඒකකයක කටයුතු සඳහා පහසුකම් සැලසීම;

(iii) තීතොය ආරක්ෂා කිරීම සඳහා නියම කර ඇති ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි හා ප්‍රමිතීන් අනුගමනය කිරීම සඳහා;

(c) මෙම පනතේ නීති අනුව තීරණය වෙන පරිදි ක්‍රියා පරිපාටි සහ කාලසීමාවන්ට අනුකූලව තීතොය හි ආරක්ෂක අවදාන ඇගැයීම්, විගණන සහ අවදානමට ලක්වීමේ නැඹුරුතාව ගැන ඇගැයීම් පැවැත්වීම.

(d) නීති මඟින් දක්වා ඇති ආකෘතියෙන්, ආකාරයෙන් හා කාලසීමාව තුළ සැලසුම්කරණය, සැකැසීම, ආරක්ෂාව සහ තීතොය මෙහෙයවීමට හෝ හිමිකරුගේ පාලනය යටතේ පවතින වෙනත් ඕනෑම අන්තර්සම්බන්ධිත පරිගණකයක හෝ පරිගණක පද්ධති සම්බන්ධ වෙනත් එවැනි තාක්ෂණික විස්තර හෝ තොරතුරු ලබා දීම;

(e) තීතොය හි සයිබර් ආරක්ෂණ මට්ටම පිළිබඳව දැනගැනීමට අවශ්‍ය වෙනත් කිසියම් තොරතුරක් ආකෘතියෙන්, ආකාරයෙන් හා කාලසීමාව තුළ නියෝජිතායතනය වෙත ලබා දීම සහ CERT ආයතනය වෙත නම් කරන ලද තීතොය හෝ හිමිකරුගේ

පාලනය යටතේ පවතින වෙනත් ඕනෑම අන්තර්සම්බන්ධිත පරිගණකයක හෝ පරිගණක පද්ධති සම්බන්ධ ඕනෑම සයිබර් ආරක්ෂණ සිදුවීමක් පිළිබඳව නීති මඟින් දක්වා ඇති ආකෘතියෙන්, ආකාරයෙන් හා එබඳු සිදුවීමක් දැනගැනීමෙන් පැය 24 නොඅඩු කාලයකදී දැනුම් දිය යුත්තේය.

## VI වැනි කොටස

### නියෝජිතායතනයේ අරමුදල

**20**. (1) නියෝජිතායතනය සතුව එහිම අරමුදලක් තිබිය යුත්තේය (මින්මතුවට "අරමුදල" ලෙස හඳුන්වන).

(2)

(a) ඒකාබද්ධ අරමුදලෙන් නියෝජිතායතනයේ කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද සියලුම මුදල් ප්‍රමාණ

(b) මෙම පනත යටතේ තම බලතල, රාජකාරි සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීමේදී නියෝජිතායතනයට ලැබෙන සියලු මුදල් ප්‍රමාණ; සහ

(c) ඕනෑම මූලාශ්‍රයකින් නියෝජිතායතනය වෙත ත්‍යාග, ප්‍රදාන හෝ පුණ්‍යාධාර ලෙස ලැබන සියලුම මුදල් ප්‍රමාණ අරමුදලට ගෙවිය යුත්තේය.

**නියෝජිතාය තනයේ අරමුදල**

determine rules; and other

(3) මෙම පනත යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ හෝ නියෝජිතායතනය විසින් එහි බලතල, රාජකාරි සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේදී හා ඉටු කිරීමේදී සිදුවූ වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් ප්‍රමාණයන් අරමුදලෙන් ගෙවිය යුත්තේය.

(f) notify the Agency

## VII වැනි කොටස

### වැරදි සහ දඬුවම්

වැරදි සහ දඬුවම්

**21.** (1)තීතොය හි හිමිකරුවෙක් වන සෑම අයෙකුම සාධාරණ හේතුවකින තොරව මෙම පනත යටතේ පනවා ඇති වගකීම් සපුරාලීමට අපොහොසත් වුවහොත් හෝ 19(1) වගන්තියේ ( c) සිට (f) අනුව සයිබර් ආරක්ෂණ සිදුවීම් නියෝජිතායනයට සහ CERT ආයතනයට වාර්තා කිරීමට අපොහොසත් වුවහොත් මෙම පනත යටතේ වරදක් සිදුකරන අතර ඒයට වැරදිකරු වුවහොත් රුපියල් දෙලක්ෂය නොඉක්මවන දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලසීමාවකට සිර දඬුවමකට හෝ දඩය හා සිරදඬුවම යන දෙකටම හෝ යටත් විය හැක

(2) මෙම පනත යටතේ නියම කර සයිබර් ආරක්ෂණයට අදාළ ඇති රාජකාරි හා වගකීම් ඉටු කිරීමට අපොහොසත් වන ISO වරයෙක්ද වරදක් සිදු කරනු ලබයි :

එසේ වුවත් එම වරද සිදු කරන ලද්දේ සිය දැනීමෙන්, කැමැත්තෙන් හෝ සහයෝගයෙන් තොරව බව හෝ එවැනි වරදක් සිදුකිරීම වැළැක්වීමට සෑම ප්‍රයත්නයක්ම ගත් බව හෝ යම් පුද්ගලයෙකුට ඔප්පු කළ හැකි නම් එම කිසිදු පුද්ගලයෙකු වැරදිකරුවෙක් ලෙස සලකනු නොලැබිය යුතුය.

(3) නම් කරන ලද තීතොය හැර වෙනත් ආයතනයක ප්‍රධානියෙක් වන ඕනෑම පුද්ගලයෙකු මෙම පනත යටතේ රාජකාරි හා වගකීම් නිසි පරිදි ඉටු කිරීමට ISO වරයෙකුට පහසුකම් සැලසීමට අපොහොසත් වුවහොත් වරදක් සිදු කරනු ලබයි :

එසේ වුවත් එම වරද සිදු කරන ලද්දේ සිය දැනීමෙන්, කැමැත්තෙන් හෝ සහයෝගයෙන් තොරව බව හෝ එවැනි වරදක් සිදුකිරීම වැළැක්වීමට සෑම ප්‍රයත්නයක්ම ගත් බව හෝ යම් පුද්ගලයෙකුට ඔප්පු කළ හැකි නම් එම කිසිදු පුද්ගලයෙකු වැරදිකරුවෙක් ලෙස සලකනු නොලැබිය යුතුය.

(4) මෙම පනත යටතේ නඩු පැවරීම නියෝජිතායතනය මඟින් හෝ නියෝජිතායතනය මඟින් අවසර දෙන ලද නිලධාරියෙකු විසින් හෝ සිදු කළ යුතුය 21

(5) (1) වැනි උප වගන්තිය යටතේ ඕනෑම වරදකට වැරදිකරුවන් වුවහොත් වුවහොත් එම පුද්ගලයන්ගේ නම් මහජනයාගේ දැනගැනීම පිණිස මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික මාධ්‍යවල පල කිරීමට නියෝජිතායතනය පියවර ගත යුතුය.

(6) මෙම කොටසේ අරමුණු සඳහා "පුද්ගලයා" යන්නට සංස්ථාපිත ආයතනයක්, ව්‍යවස්ථාපිත අධිකාරියක්, රජයේ දෙපාර්තමේන්තුවක් ඇතුළත් විය හැක.

පුද්ගලයන් පිරිසක් විසින් වරදක් සිදුකිරීම

**22**. මෙම පනත යටතේ වරදක් පුද්ගලයන් පිරිසක් විසින් සිදු කළ විට –

(a) එය සංස්ථාපිත ආයතනයක් නම් එම සංස්ථාපිත ආයතනයේ සෑම අධ්‍යක්ෂකවරයෙක් හෝ නිලධාරියක්ද ; සහ

(b) එම පුද්ගලයන් පිරිස සමාගමක් නම් එම සමාගමේ සෑම පාර්ශ්වකරු වෙක්මද

වරදක් සිදු කොට ඇත:

එසේ වුවත් එම වරද සිදු කරන ලද්දේ සිය දැනීමෙන්, කැමැත්තෙන් හෝ සහයෝගයෙන් තොරව බව හෝ එවැනි වරදක් සිදුකිරීම වැළැක්වීමට සෑම ප්‍රයත්නයක්ම ගත් බව හෝ යම් පුද්ගලයෙකුට ඔප්පු කළ හැකි නම් එම කිසිඳු අධ්‍යක්ෂකවරයෙක්, නිලධරියෙක් හෝ පාර්ශ්වකරුවෙක් වැරදිකරුවෙක් ලෙස සලකනු නොලැබිය යුතුය

## IX වැනි කොටස

## විවිධ විධිවිධාන

මූල්‍ය වර්ෂය සහ ගිණුම් විගණනය

**23**. (1) නියෝජිතායතනයේ මූල්‍ය වර්ෂය ලිත් වර්ෂය විය යුතුය .

(2) නියෝජිතායතනයේ ගිණුම් විගණනය සඳහා රාජ්‍ය සංස්ථා විගණනයට අදාළ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 සහ 41 වගන්ති බල පැවැත්වෙනු ඇත .

**ප්‍රවේශය, පරීක්ෂා කිරීම හා සෙවීම සඳහා බලතල**
තගලපකබගපබ ඉයවනනකත

**24.** මෙම පනතේ විධිවිධාන හෝ එයින් සාදන ලද ඕනෑම නියමයක් සමඟ අනුකූලතාව දක්වන්නේදැයි සොයා බැලීම සඳහා සාධාරණ හේතූන් මත නියෝජිතායතනය හෝ නියෝජිතායතනය වෙනුවෙන් ලිඛිතව බලය ලබා දී ඇති ඕනෑම නියෝජිතයෙකු හට -

(a) නම් කරන ලද තීතොය පිහිටි ස්ථාන ප්‍රවේශවීම, පරික්ෂා කිරීම හා සෙවීම;

(b) එවැනි තීතොයට අදාළ ඕනෑම ලේඛනයක්, වාර්තාවක් හෝ ඉන් කොටසක් පරීක්ෂා කිරීම සහ පිටපත් ගැනීම;

(c) කිසියම් පුද්ගලයෙකු තීතොය හිමිකරුවක් හෝ එවැනි තැනක සේවකයෙකු ලෙස සැලකීමට සාධාරණ හේතු තිබේ නම් එවැනි ඕනෑම පුද්ගලයෙකු පරීක්ෂා කිරිමට

**නියෝජිතායතනය (26 වැනි අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථාන්විතව උපලේඛන ගත ආයතනයක් බව**

**25.** මෙම පනතේ අරමුණු සඳහා –

(a) නියෝජිතායතනය ; සහ

(b) CERT ආයතනය සහ ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානය,

(26 වැනි අධිකාරය වූ ) අල්ලස් පනත යටතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර එම පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතුය.

**නියෝජිතායතනයේ සාමාජිකයන්, නිලධාරීන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව**

**26**. මෙම පනතේ අරමුණු සඳහා –

(a) නියෝජිතායතනයේ මණ්ඩලයේ සියලුම සාමාජිකයන්, නිලධාරීන් හා සේවකයන්; සහ

(b) CERT ආයතනයේ හා NCSOC හි සියලු නිලධාරින්,
(19වැනි අධිකාරය) වූ දණ්ඩ නීති සංග්‍රහයේ කාර්ය සඳහා රජයේ නිලධාරින් ලෙස සැලකිය යුතුය.

**ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත්පත් කරගැනීම**

**27**. (1) නියෝජිතායතනයේ විශේෂිත අරමුණක් සඳහා ඕනෑම නිශ්චල දේපළක් අත් කරගැනීමට අවශ්‍ය විටකදී අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියෝගයක් මඟින් එම අරමුණ සඳහා යෝජිත අත් කර ගැනීම අනුමත කරන්නේ නම් එම දේපළ පොදු අරමුණක් සඳහා අත් කරගත් බව සැලකිය යුතු අතර ඒ අනුව ඉඩම් අත් කරගැනිමේ පනත යටතේ අත් කොටගෙන නියෝජිතායතනයට පවරනු ලැබේ.

(2) නියෝජිතායතනය වෙනුවෙන් ඕනෑම නිශ්චල දේපළක් ඉඩම් අත්පත් කරගැනීමේ පනත යටතේ අත්පත් කරගැනීමට ගෙවිය යුතු ඕනෑම මුදල් ප්‍රමාණයක් නියෝජිතායතනයේ අරමුදලෙන් ගෙවිය යුතුවේ.

**නඩු පැවරීමක් හෝ නඩුවක් සඳහා වියදම අරමුදලෙන් ගෙවිය යුතු බව**

**28**. (1) යම් අධිකරණයක් ඉදිරියේ නියෝජිතායතනය විසින් හෝ නියෝජිතායතනයට එරෙහිව පවරනු ලබන යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී දැරිය යුතු වියදම් නියෝජිතායතනයේ අරමුදල් වලින් ගෙවිය යුතු වන අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී නියෝජිතායතනයට ලැබෙන යම් ගෙවීමක් හෝ නියෝජිතායතනය විසින් කරනු ලබන යම් අයකිරීමක් අරමුදලට බැර කළ යුත්තේය.

(2) නියෝජිතායතනයේ යම් සාමාජිකයෙකු, හෝ යම් නිලධාරියෙක් හෝ සේවා නියුක්තිකයෙකු විසින් මේ පනතේ විධිවිධාන යටතේ හෝ වෙනත් කිසියම් ලිඛිත නීතියක් යටතේ හෝ නියෝජිතයාතනයේ විධානය මත කරන ලද හෝ කරන ලදැයි උදදේශිත යම් ක්‍රියාවක් සම්බන්ධව එම තැනැත්තාට එරෙහිව යම් අධිකරණයක හෝ විනිශ්චය අධිකාරියක් ඉදිරිපිටට ගෙන එනු ලබන කවර හෝ සිවිල් හෝ අපරාධ හෝ නඩුවකදී එම ක්‍රියාව සද්භාවයෙන් කරන ලද බවට අධිකරණය තීරණය කරන්නේ නම් ඒ සඳහා වන වියදම් එම නඩුවේදි එම තැනැත්තාට අය කරගත හැකි නම් මිස නියෝජිතායතනයේ අරමුදලෙන් ගෙවිය යුතුය.

**වාර්ෂික වාර්තා**

**29**. (1) නියෝජිතායතනය විසින් සෑම මූල්‍ය වර්ෂයක්ම අවසාන වීමෙන් සයමසක් ඇතුළත එම මූල්‍ය වර්ෂය තුළ නියෝජිතායතනය විසින් කරගෙන යන ලද ක්‍රියාකාරකම්වල වාර්ෂික වාර්තාවක් අමාත්‍යවරයා වෙත භාර දිය යුතු අතර එම වර්ෂයට අදාළ පහත සෑම ලියවිල්ලකම පිටපතක්ද බැගින් එම වාර්තාවට ඇමිණීමට සැලැස්වියුතුය

–

(අ) විගණනාධිපතිගේ වාර්තාව සමඟ වර්ෂය සඳහා නියෝජිතායතනයේ විගණනය කරන ලද ගිණුම් ;

(ආ) නියෝජිතායතනය විසින් පෙර වර්ෂය තුළදී සිදු කරන ලද ක්‍රියාකාරකම් වල වාර්තාවක් ; සහ

(ඇ) එම වාර්තාව සහ ගිණුම් අදාළ වර්ෂයට ඉක්බිතිවම වූ වර්ෂය සඳහා යෝජි ක්‍රියාකාරකම්වල වාර්තාව

(2) (1) වැනි උපවගන්තිය යටතේ භාර දෙනු ලැබූ වාර්තාවේ හා අනෙකුත් ලියකියවිලිවල පිටපත් අමාත්‍යවරයා විසින් එම වාර්තාව ලැබුණු දිනයේ සිට සය මසක් ඇතුළත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

අමාත්‍යවරයා ගේ විධාන

**30**. (1) නියෝජිතායතනයේ අරමුණුවලට අදාළ ආණ්ඩුවේ ප්‍රතිපත්ති නිසි පරිදි බලගැන්වීම සහතික කළ හැකි වන පරිදි නියෝජිතායතනයේ බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට හා ඉටුකිරීමට අමාත්‍යවරයා විසින් කලින් කල නියෝජිතායතනය වෙත පොදු හෝ විශේෂ විධාන නිකුත් කළ හැකිය. එවැනි විධාන ක්‍රියාවට නැංවීම නියෝජිතායතනයේ කාර්යය විය යුතුය.

(2) අමාත්‍යවරයා විසින් නියෝජිතායතනය කටයුතු වලට අදාළ වාර වාර්තා, ගිණුම් සහ වෙනත් යම් තොරතුරු අමාත්‍යවරයාට අවශ්‍ය විය හැකි ආකාරයට සපයන ලෙස නියෝජිතායතනයට විධානය කළ හැකි අතර එම විධාන ක්‍රියාවට නැංවීම නියෝජිතායතනයේ කාර්යය විය යුතුය.

**31.** (1) මේ පනතේ විධිවිධාන වලට යටත්ව මෙම පනත යටතේ රීති සෑදීමට පනත මඟින් බලය ලබා දී ඇති හෝ සෑදීමට අවශ්‍ය සෑම කරුණක් පිළිබඳ රීති සෑදීමට නියෝජිතායනයට හැකිය.

රීති

(2) නියෝජිතායතනය විසින් සාදන සෑම රීතියක්ම අමාත්‍යවරයා විසින් අනුමත කළ යුතු අතර ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර එසේ පළ කළ දිනයේ හෝ නිශ්චිතව සඳහන් කළ යම් පසු දිනයක හෝ ක්‍රියාත්මක විය යුතුය.

**32.** (1) අමාත්‍යවරයා විසින් නියෝජිතායතනයේ සහයෝගය ඇතිව මෙම පනත මඟින් නියම කරනු ලැබිය යුතු බවට නියමිත හෝ නියෝග සාදනු ලැබිය යුතු බවට මේ පනත මඟින් බලය දී ඇති හෝ සියලු කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැක.

නියෝග

(2) නිශ්චිතවම හා (1) වැනි උප වගන්තිය මඟින් ලබා දී ඇති බලයන්ගේ පොදු බවට අගතියකින් තොරව අමාත්‍යවරයා විසින් පහත දක්වා සෑම හෝ නිශ්චිත කරුණක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකිය:-

(අ) තීතොය නම් කිරීමට;

(ආ) තීතොය හිමිකරුවන්ගේ රාජකාරි හා වගකීම්;

(ඇ) සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය පදනම් කරගත් රජය විසින් අනුගමන කළ යුතු ප්‍රමිති සහ ක්‍රියා පටිපාටි සහ රාජ්‍ය ආයතන සහ පරිගණක හෝ පරිගණක පද්ධති සඳහා ආරක්ෂක සැලසුම්;

(ඈ) සයිබර් ආරක්ෂණ පුහුණු වැඩසටහන සහ පුහුණු ආයතන ප්‍රතීතනය සඳහා වන ප්‍රමිතීන්;

(ඉ) ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානය හා සම්බන්ධ වීමට ක්‍රියාපටිපාටිය;

(ඊ) සයිබර් ආරක්ෂණ විගණකවරුන් ප්‍රතීතනය සඳහා ප්‍රමිතීන් ;

(උ) සයිබර් ආරක්ෂණ අවදානම ඇගැයීම සඳහා ක්‍රියා පරිපාටි හා කාලසටහන්;

(ඌ) තීතොය හි ආරක්ෂණ විගණන හා අවදානමට ලක්වීමේ හැකියාව ඇගැයීම සඳහා ක්‍රියා පරිපාටි හා කාල සටහන්;

(එ) CERT ආයතනය විසින් නියෝජිතායතනය වෙත සයිබර් ආරක්ෂණ සිදුවීම් වාර්තා කරන ආකෘතිය හා ආකාරය;

(ඒ) නියෝජිතායතනය විසින් පත් කරන ලද ISO වරුන්ගේ රාජකාරි හා වගකිම්;

(ඔ) සියලුම රජයේ ආයතන සහ අනෙකුත් අදාළ අංශ විසින් CERT ආයතනය වෙත සයිබර් ආරක්ෂණ සිදුවීම් වාර්තා කරන ආකෘතිය හා ආකාරය;

(ඕ) සියලුම ආංශික CERT ආයතන සහ වෙනත් ඕනෑම CERT ආයතනයක් විසින් CERT ආයතනය වෙත සයිබර් ආරක්ෂණ සිදුවීම් වාර්තා කරන ආකෘතිය හා ආකාරය;

(ක) සියලුම රජයේ ආයතනවල පරිගණක, පරිගණක පද්ධති හෝ අනෙකුත් ඕනෑම ඩිජිටල් යටිතල පහසුකමක් ආරක්ෂා කරගැනීම සඳහා ප්‍රතිපත්ති, ක්‍රියා පරිපාටි හා ප්‍රමිතීන්;

(ග) සියලු රජයේ ආයතන සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුකූලතාවය දැක්වීමට අදාළ කොන්දේසි;

(2) (1) වැනි සහ (2) වැනි උප වගන්ති යටතේ සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර එසේ පළ කළ දිනයේ හෝ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කළ යම් පසු දිනයක හෝ ක්‍රියාත්මක විය යුතුය.

(3) (1) වැනි උප වගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ සැණින්ම අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු අතර එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එම අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතුය .

(4) එලෙස යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.

අර්ථ නිරූපණය

**33**. මෙම පනතේ කාර්යය සඳහා සන්දර්භය මත අන් ආකාරයකින් අවශ්‍ය වුවහොත් මිස–

"ස්වයංක්‍රීය" යනු නිශ්චිත මැදිහත්වීමකින් තොර යන්නයි;

“ පරිගණක පද්ධතියක්” යනු යම් උපාංගයක් හෝ අන්තර්සම්බන්ධිත හෝ ඊට අදාළ උපංග සමූහයක් වන අතර එයින් එකක් හෝ වැඩි ගණනක් වැඩසටහන් ගත කිරීමක් අනුව ස්වයංක්‍රීය දත්ත සැකැස්ම සිදු කරනු ලැබේ;

පරිගණක වැඩසටහන්" යනු අදහස් කරන ලද ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා පරිගණකය විසින් ක්‍රියාත්මක කළ හැකි උපදෙස් මාලාවක් වේ;

"සයිබර් ආරක්ෂණය" යනු සයිබර් අවකාශය ආරක්ෂිත සහ සුරක්ෂිත කිරීම සඳහා  අදහස් කරන ක්‍රියාකාරකම් මාලාවක් වේ;

27

"අමාත්‍යවරයා" යනු සයිබර් ආරක්ෂණයට අදාළ විෂයයන් හා කාර්යයන් පැවරී ඇති අමාත්‍යවරයාය.

"සැකසුම් දත්ත" යනු පරිගණක පද්ධතියේ දත්ත පරිගණක වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම මඟින් මෙහෙයවන බවයි.

**සිංහල පාඨය බලපැවැත්විය යුතු බව**

**34**. මෙම පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

22/05/19